# ක්‍රි. ව 1815 උඩරට ගිවිසුම සහ විමුක්ති අරගලයකට පසුබිම සැකසීම පිළිබඳ අධ්‍යයනයක්.

කථිකාචාර්ය එම්.ඒ.ප්‍රසාද් කුමාර
මානවශාස්ත්‍ර අධ්‍යනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
B.A(Hons) In History(SJP),M Phil (Reading) (Kelaniya)

1817 - 1818 ඌව වෙල්ලස්සෙන් ඇරඹි සටන් ව්‍යාපාරය දේශප්‍රේමී විමුක්ති අරගල ඉතිහාසයෙහි සංධිස්ථානයක් බවට පත් වී තිබේ. මෙකී අරගලය බ්‍රිතාන්‍යයන්ට එරෙහිව සිදුකරන ලද කැරැල්ලකටත් වඩා දේශප්‍රේමීන් වෙතින් ඉදිරිපත් වූ විමුක්ති අරගලයක් ලෙස හඳුන්වාදීම නිවැරදි ය. ශ්‍රී ලාංකේය ඉතිහාසයේ අනාදිමත් කාලයක සිට විරවරයන් නිර්මාණය කළ භූමිය වුයේ රෝහණයයි. 1818 බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය විරෝධී කැරැල්ලේ නායකත්වය ගත් වීරවරයා ද රුහුණු දනව්වේ ඌව වෙල්ලස්සෙන් බිහිවීම කැපී පෙනෙන කරුණකි. ආරම්භක අවස්ථාවේදි තැන් තැන් වල ඇති වූ හුදකලා කැරැල්ලක් මෙන් මේ සටන ක්‍රියාත්මක වුවත් පසුව එය නිදහස් අරගලයක ස්වරූපය ගනිමින් වේගයෙන් ව්‍යාප්ත වූයේ ය. **ඉංග්‍රීසින් යටතේ සිටි කැප්පෙට්ටිපොළ වැනි දේශිය වීර නායකයින් විදේශීය පාලනයෙන් ඉවත්ව අරගලයේ නායකත්වය ගැනීමත් සමග මෙකී අරගලය වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම විමුක්ති අරගලයක් බවට පත්වී තිබේ.** මෙසේ 1815 දී ආරම්භ වූ උඩරට ඉංග්‍රීසි පාලන බලය බිඳ දමා ස්වදේශීයන්ගේ රාජ්‍යයක් පිහිටුවීමේ අදහසින් ගෙන යන ලද්දා වූ විමුක්ති අරගලය හා ඊට පසුබිම් වූ 1815-1818 අතර පැවති දේශපාලන ව්‍යාකූලතාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යනයක් සිදු කිරීමට මෙමගින් අපේක්ෂා කෙරේ. මෙම අධ්‍යයනය සඳහා තොරතුරු රැස් කිරීමේ දී මූලික වශයෙන් පුස්තකාල පරිශීලනය කරන ලද අතර ඒ යටතේ ප්‍රස්තුතයට අදාළ ව මෙතෙක් පළ වී ඇති ප්‍රාථමික හා ද්විතීයක මූලාශ්‍රය අධ්‍යයනයට ලක් කෙරිණි. එසේම බ්‍රිතාන්‍ය පාලනය පිළිබඳ පැරණි වාර්තා, රාජ්‍ය ලේඛනාගාරයේ තැන්පත්ව ඇති තොරතුරු, ආදි ප්‍රාථමික මූලාශ්‍රය කෙරෙහි වැඩි අවධානයක් යොමු විය. ලංකාවේ විවිධ විද්වතුන් මෙරට බ්‍රිතාන්‍ය පාලනයට අදාළව සිදු කළ පර්යේෂණ කෘති හා ශාස්ත්‍රීය කෘති දෙවන මූලාශ්‍රය වශයෙන්

පරිශීලනය කෙරිණි. එම සියලු දත්ත පදනම් කොට ගනිමින් ප්‍රස්තුතය විචාරාත්මක ප්‍රවේශයකින් සාකච්ඡාවට බඳුන් කිරීම මෙහි ක්‍රමවේදය වෙයි.

ශ්‍රී ලාංකේය ඉතිහාසයේ සිදු වූ ප්‍රථම නිදහස් අරගලය හා ඊට පසුබිම් වූ උඩරට ව්‍යාකූලතා පිළිබඳව අධ්‍යයනයේ දී ශ්‍රී ලංකාවට එල්ල වූ යුරෝපීය බලපෑම හා එහි ස්වභාවය පිළිබඳව මූලික අවධානයක් යොමු කිරීම වැදගත් වේ. ශ්‍රී ලංකාව පිළිවෙළින් පෘතුගීසි, ලන්දේසි සහ ඉංග්‍රීසි යන යුරෝපීය ජාතීන්ගේ ග්‍රහණයට ලක් වී තිබෙන අතර ඉන් වැඩිම බලපෑම සිදු කිරීමට බ්‍රිතාන්‍යයන් සමත් වී තිබේ. එසේ වුව ද මෙම අධිරාජ්‍යවාදීන් සියලු දෙනාට ම පාහේ මුහුදුබඩ ප්‍රදේශවල තම බලය පැතිරවීමට හැකියාව ලැබුණත්, උඩරට රාජ්‍යය අල්ලා ගැනීම උදෙසා කරන ලද ආක්‍රමණ සෑම එකක්ම පාහේ බිහිසුණු පරාජයක් හමුවේ නවතා දැමීමට සිදු වූ ආකාරයන් ඉතිහාසය පුරාම හඳුනාගත හැකි ය.

බ්‍රිතාන්‍යයන්ට එරෙහිව උඩරට වැසියන් තුළ පැවති මෙකී පෞරුෂය ක්‍රි.ව. 1739 න් පසුව කිසියම් දුරකට බිඳ වැටෙන්නට හේතු වූ බවක් හඳුනාගත හැකි ය. ඊට ප්‍රධාන හේතුව වූයේ නායක්කර් වංශිකයන් රාජ්‍යත්වයට ප්‍රවේශය ගැනීමත් සමඟ රජු හා රදළ ප්‍රධානීන් අතර වර්ධනය වූ සිංහල සහ හින්දු භේදයයි. මෙකී භේදය ක්‍රි.ව. 1798 දී බලයට පත් ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගෙන් පසුව වඩ වඩාත් වේගයෙන් ව්‍යාප්ත වන්නට විය. උඩරට රාජ්‍යයේ නිර්මාණය වෙමින් ආ ව්‍යාකූල පරිසරය අවස්ථාවක් කොටගත් බ්‍රිතාන්‍යයන් උඩරට අල්ලා ගැනීමට හොඳම අවස්ථාව මෙය යැයි සිතා ජෝන් ඩොයිලි යටතේ උපක්‍රමශීලී ක්‍රියා මාර්ග අරඹා තිබේ. ඔවුන්ගේ එක ම අපේක්ෂාව වූයේ යුද්ධයකින් තොරව උඩරට අල්ලා ගැනීමයි. කුඩැල්ලකු තරමටවත් හිංසාවක් නොමැතිව, ක්‍රි.ව. 1815 දී ශ්‍රී වික්‍රම රාජසිංහ සිහසුනෙන් පහකොට උඩරට රාජ්‍යය ඉංග්‍රීසීන්ට පවරා දීමට හැකි සම්මුතියකට එළඹීමට හැකිවූ බව ඩොයිලි සඳහන් කර තිබේ. මෙකී ගිවිසුම සම්මත වීමේ දී උඩරට රාජ්‍යය වෙනුවෙන් රදළ ප්‍රධානීන් ද, බ්‍රිතාන්‍ය කිරීටය වෙනුවෙන් රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා ද අත්සන් කර තිබේ. මෙසේ අත්සන් කළ උඩරට සම්මුතිය පරිදි බ්‍රිතාන්‍යයන් උඩරට රාජ්‍යය තුළ සිය බලය ගොඩ නගා ගත්තේ ගිවිසුම් ප්‍රකාරව කටයුතු කරන බවට පොරොන්දු වීමෙනි. එහෙත් එකී කොන්දේසි

පිළිබඳ බ්‍රිතාන්‍යයන්ගේ ක්‍රියාකාරිත්වය 1817 - 1818 ඉංග්‍රීසි විරෝධී සටනට හේතු සාධක සපයා තිබේ.

ක්‍රි.ව 1815 මාර්තු 02 වන දින උඩරට රාජ්‍යය යටත් කර ගැනීමෙන් පසු අත්සන් කරන ලද උඩරට ගිවිසුම පසුකාලීන ව්‍යාකූලතා රැසක ආරම්භයකි. සෙංකඩගල අග නගරයෙහි රාජකීය මාළිගා අභ්‍යන්තරයෙහි පිහිටි මගුල් මඩුවේ දී අත්සන් කරන ලද මෙකී ගිවිසුමෙහි ගාම්භීරභාවය පිළිබඳව වර්ෂ 1815 මාර්තු මස 06 වැනි දින නිකුත් කරන ලද ගැසට් පත්‍රයේ මෙසේ දක්වා තිබේ.

"බ්‍රිතාන්‍යයේ අතිඋතුම් රිජන්ට් කුමාර මහා රාජෝත්තමයාණන් වහන්සේ වෙනුවෙන් ආණ්ඩුකාර උතුමාණන් වහන්සේ හා හමුදා සේනාවේ නායකයාණෝ එක් පාර්ශවයකින් ද, අදිකාරම්වරු, දිසාවේවරු, ඇතුළු මහනුවර දිසාවේ ප්‍රධානීහු ද, අනෙක් පාර්ශවයෙන් රටවැසියන් වෙනුවෙන් ද, රැස්වී මොහොට්ටාල, කෝරාළලා, විදානේලා, ආදී රට ඇතුළේ සුළු ප්‍රධානීන් හා වැසියන් ද මහත් සමූහයක් ඉදිරිපිට දී අද දින රජ මාළිගා අභ්‍යන්තර මගුල් මඩුවේ ශාලාවේ දී අති ගාම්භීර සම්මන්ත්‍රණයක් පවත්වන්නට යෙදුණා ඇත. මහා රාජෝත්තමයාණන් වහන්සේ ආණ්ඩුව කන්ද උඩරට දිසාවන් පිහිටුවීම සඳහා මුලින් ඇති කර ගන්නා ලද සම්මුතියේ කොන්දේසිවලට අනුව පිළියෙල කරන ලද්දා වූ ප්‍රසිද්ධ ලේඛනයක් හෙවත් ගිවිසුම් පත්‍රයක් ඊට පෙර ඉදිරිපත් කරන ලදුව එය පළමුව ඉංග්‍රීසියෙන් ද, දෙවනුව සිංහලෙන් ද කියැවීමෙන් පසු ඒකමතික තීරණයකට එළඹ ගන්නා ලදී."

උඩරට සම්මුතිය වගන්ති 12 කින් සමන්විත විය. ඒවා හුදෙක් දෙපක්ෂය විසින් පිළිගන්නා ලද සමූහයක් පමණක් නොව ඉංග්‍රීසින් විසින් නිකුත් කරන ලද නීති සමුදායක් බවට ද පත් විය. එම වගන්ති පහත පරිදි වේ.

| | |
|---|---|
| 1-2 වන වගන්ති - | ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ රාජ්‍යය බලතල අහෝසි කිරීම. |
| 3 වන වගන්තිය - | රජතුමා සහ ඔහුගේ පිරිස රාජ්‍ය ද්‍රෝහීන් වශයෙන් නම් කොට මළබාර් පිරිස ශ්‍රී ලංකාවෙන් පිටමං කළ බව දැක්වීම. |
| 4 වන වගන්තිය - | මහනුවර රාජ්‍ය බලය ඉංග්‍රීසි රජයට පැවරූ අතර රදලවරුන්ට සිය බලය භුක්ති විදීමට අවසර ලබාදීම. |
| 5 වන වගන්තිය - | බුදුසමය නොකෙළසිය යුතු ය. පන්සිල් හා භික්ෂූන් රක්ෂා කර යුතු ය. යන්න දැක්වීම. |

6-7 වන වගන්ති - කිසිවෙකු වධහිංසා පැමිණවීම තහනම් බවත් බ්‍රිතාන්‍ය රජයේ අවසරය නොමැතිව මරණ දඬුවම් දිය නොහැකි බවත් සිවිල් හා අධිකරණ අංශ මෙතෙක් රටේ පැවති සම්ප්‍රදායන්ට අනුව සිදුකළ යුතු බවක් දැක්වීම.

8 වන වගන්තිය - අධිකරණ සංවිධානය රට තුළ පාලන ආයතන මගින් සිදු කළ යුතුය.

9 වන වගන්තිය - මහනුවරින් සිට වැසියන්ට එම නීතිය හා අධිකරණ බලය නොපැවැත්විය යුතුය.

10 වන වගන්තිය - කලින් නිකුත් කළ සියලු නිවේදන මින් අහෝසි වේ.

11 වන වගන්තිය - රටේ සියලුම ආදායම ඉංග්‍රීසි රජයට හිමිය.

12 වන වගන්තිය - මහනුවර රාජ්‍යය තුළ වෙළඳ කටයුතු කරගෙන යාම බ්‍රිතාන්‍ය රජයේ නියෝගයන් පරිදි සිදුවිය යුතුය.

මෙකී ගිවිසුම් උඩරට නීත්‍යානුකූල බලය නිසැකයෙන්ම බ්‍රිතාන්‍යයන් සතු වූ බව පෙනේ. එහෙත් උඩරටියන්ගේ ප්‍රමුඛ අපේක්ෂාව වූයේ අදූරදර්ශි පාලනයක් ගෙන ගිය ශ්‍රී වික්‍රම රාජසිංහයන්ගේ බලය මැඩලා සිහසුනෙන් පහකර දැමීමක් මිස බ්‍රිතාන්‍ය ආධිපත්‍යය උඩරට පිහිටුවා ගැනීම නොවේ. "ඔබලා විසින් රජු බලයෙන් පහ කොට අවසන් ය. ඔබලා ට කිරීමට තවත් කිසිවක් නොමැත. ඒ නිසා දැන් ඔබලාට පිටවී යා හැකිය." යනුවෙන් රදල ප්‍රධානියෙකු කර ඇති ප්‍රකාශයෙන් එය වඩාත් තහවුරු වේ. එහෙත් ඉංග්‍රීසීන්ගේ ඒකායන අපේක්ෂාව රාජසිංහ රජු බලයෙන් පහකර දැමීම පමණක් නොව ආක්‍රමණ මගින් අල්ලා ගත නොහැකි වූ උඩරට තුළ උපක්‍රමශීලීව තම ආධිපත්‍ය ගොඩනංවා ගැනීම ය. මේ හේතුවෙන් උඩරට ඉංග්‍රීසි බලය ආරම්භ වීමටත් පෙරාතුව සියලු ජන කොටස්වල අප්‍රසාදයක් ගොඩනැගුණු බව පෙනී යන්නේ **මහනුවර මඟුල් මඩුව ඉදිරිපිට දී වාරියපොළ සුමංගල හිමියන් ඉංග්‍රීසි කොඩිය බිම හෙළා සිංහලේ කොඩිය එසවීම මගිනි.** එය සුළු කොට තැකිය හැක්කක් නොවන අතර විදේශීය ආධිපත්‍යයට එරෙහි විමුක්තිකාමී සටනකට පදනම එමගින් සැකසුණු බවක් පෙනෙන්නට තිබේ.

සමස්ත දිවයිනේ ම බලය ගොඩ නඟාගත් බ්‍රිතාන්‍යයන් දේශීය ජනතාවගේ අවශ්‍යතාවන් සපුරාදීමට පොරොන්දු වුවත් 1815 උඩරට අත්සන් කළ ගිවිසුම මගින් අපේක්ෂිත පරමාර්ථ ක්‍රමිකව ඉටු නොවූ පසුබිමක් නිර්මාණය විය. බ්‍රිතාන්‍ය ආණ්ඩුව වනාහී ක්‍රිස්තු ධර්මය මතම ගොඩනගා ගත් ආණ්ඩුවක් වන බැවින් එකී නව ආණ්ඩුව යටතේ ගිවිසුමෙහි අන්තර්ගත වූ පස්වන වගන්තිය කඩවන ස්වභාවයක් දක්නට ලැබුණි. ඔවුන් බෞද්ධ නොවූ පාලකයන් වූ නිසා ගිවිසුම් ප්‍රකාරව බෞද්ධ පාලකයන් මෙන්ම බුදු දහමට ආරක්ෂාව සැලසීම, දළදා මාළිගාව වැනි ප්‍රධාන පෙළේ බෞද්ධ සිද්ධස්ථානයකට නියමිත වත් පිළිවෙත් සිදුකිරීම හෝ භික්ෂූන්ට වැඳුම් පිදුම් කිරීම සිදු කළ නොහැක්කක් විය. ගිවිසුම මගින් භික්ෂූන්ගේ අයිතිවාසිකම් හා වරප්‍රසාද ආරක්ෂා කළ නොහැක්කක් විය. ගිවිසුම මගින් භික්ෂූන්ගේ අයිතිවාසිකම් හා වරප්‍රසාද ආරක්ෂා කරනවා වෙනුවට ක්‍රමක්‍රමයෙන් භික්ෂූන් ආණ්ඩුකාරවයාට බුහුමන් දක්වන තත්ත්වයට පත්ව තිබේ. විශේෂයෙන් ම මෙම වගන්ති පිළිබඳව සිය අදහස ගෙන එන රොබට් බ්‍රවුන්රිග් සඳහන් කර ඇත්තේ "කන්ද උඩරැටියන් තම ආගම වෙත දක්වන අසීමිත භක්තිය නිසා එවැනි නුසුදුසු වචන යෙදු වගන්තියක් ඇතුළත් කිරීමට තමා පෙළඹුණු බවයි. ඒ පිළිබඳව දැඩිව අවධාරණය කරන බ්‍රවුන්රිග් සඳහන් කරන්නේ මිත්‍යාදෘෂ්ටිය ආරක්ෂා කිරීම සඳහා තමා බලාපොරොත්තු වූවාට වඩා අවධාරණාත්මක අන්දමේ බන්ධනයක් බ්‍රිතාන්‍ය රජය කෙරෙහි ඇති කර තිබෙන බවත්, එහෙත් කන්ද උඩරට සියලුම පන්තීන්හි ජනතාව එම ආගම කෙරෙහි දක්වන ඉමහත් භක්තියත් ඔවුන් තුළ ආගමේ අනාගත අපේක්ෂාව කෙරෙහි පහළවන සැකයක් නිසා "ඇත්ත වශයෙන්ම මේ පළාත් කෙරෙහි අපේ අනාගත අයිතිය මෙබඳු වගන්තියක් නොවේ නම් තහවුරු කර ගැනීමට නොහැකි වන බව ය."

ඒ අනුව මෙම වගන්තියෙහි පැවති ව්‍යාකූලභාවය හා අනාගතයේ ඇතිවිය හැකි ගැටුම්කාරී තත්වයන් පිළිබඳව රොබට් බ්‍රවුන්රිග් සතුව අවබෝධයක් පැවති බව පැහැදිලි වේ. ඉංග්‍රීසි පාලකයන් විසින් ක්‍රමයෙන් සම්මුතියෙහි පස්වන වගන්තියට පටහැනිව ක්‍රියා කිරීම නිසා බුදු දහම හා බුද්ධ ශාසනය ක්‍රමවත්ව හා ආරක්ෂා සහිතව පවත්වා ගැනීම සඳහා බෞද්ධ රජෙකුගේ අවශ්‍යතාව භික්ෂූන් වහන්සේලාට දැනෙන්නට පටන් ගෙන තිබේ.

දේශීය සම්ප්‍රදාය තුළ සියල්ලට ඉහළින් රජුගේ ඒකාධිකාරිය ක්‍රියාත්මක වුවත් නව පාලන ක්‍රමය යටතේ ආණ්ඩුකාරවරයා ප්‍රබල ස්ථානයක පිහිටියේ ය. ඇතැම් අවස්ථාවල දී දේශීය රදල ප්‍රධානීන්ට ආණ්ඩුකාරවරයාට පමණක් නොව සොල්දාදුවන්ට, ඉංග්‍රීසි සිවිල් පුද්ගලයන්ට පවා දෙවැනි තත්ත්වයක වරප්‍රසාද හිමි වූයේ ය. ඇතැම් අවස්ථාවල දී ඉංග්‍රීසි සොල්දාදුවන් ඇතුන් අසුන් පිටින් පවා වංශවත් රදල ප්‍රධානීන් අසලින් ගමන් කළ අවස්ථා දක්නට ලැබුණි. එකී ව්‍යාකූල පරිසරය පිළිබඳව ජෝන් ඩේවි සිය කෘතියේ මෙසේ දක්වා තිබේ.

"අප හා ඔවුන් අතර අනුකූලතාවක් නොවීය. අප දෙපක්ෂය එක් කරන එක් කරුණක් වුව නොතිබුණු නමුත් අප වෙන් කරන පිළිකුල් උපදවන කරුණු බොහෝ විය. නිළමේවරු රජු සිටිය දී තරම් පාලනය නොකෙරුණු නමුදු තම රටවල දී පෙර නොවූ විරූ වැඩි බලයක් ක්‍රියාත්මක කළ නමුදු ශක්තිමත් නොවූහ. ඉහත කාලයේ දී ඔවුනට ඉහළින් සිටියේ රජු පමණි. දැන් ඔවුහු අප සේවයේ යෙදී සිටින හැම සිවිල් නිලධරයෙකුට ම අප යුධ හමුදාවේ හැම නිලධරයකුට ම වඩා පහත් වූහ. රාජකාරී අවස්ථාවන්වල දී ගෞරව සම්පයුක්තව ඔවුනට සංග්‍රහ කරන ලද නමුත් ඒ රාජකාරී අවස්ථාවන්හී දි පමණි. කුමක් නිසා ද යත් සාමාන්‍ය යුද භටයන් පවා අති කුලහීන මිනිසකු පසු කර යන්නාක් මෙන් කිසි ගරු සරුවක් නැතිව උඩගු උඩරට ප්‍රධානියන් පහු කර ගිය හෙයින් මේ නිසා ඔවුන්ගේ ශ්‍රී විභූතිය අහෝසි වී යයි ද ඔවුන්ගේ ආත්ම ගෞරවය කෙළෙසි ඇතැයි ද ඔවුහු සිතූහ. හැම මිනිසා තුළ ම මේ සම්බන්ධයෙන් මෙබඳු පොදු හැඟීමක් තිබිණි. යටත් පිරිසෙයින් වැදගත් එසේම ඉතා වැඩි ජන සංඛ්‍යාව අතර මෙසේ විය."

ඩේවිගේ මේ ප්‍රකාශය අනුව රදලවරුන්ගේ සමාජ තරාතිරම බ්‍රිතාන්‍ය පාලනය හමුවේ බිඳ වැටුණු ස්වභාවය අවබෝධ කර ගත හැකි ය. මේ සියල්ල ඉංග්‍රිසි පාලනයට එරෙහිව වූ විමුක්ති අරගලයක අවශ්‍යතාවට පූර්ව පදනම් සකස් කිරීමට ඉවහල් වූ ආකාරය හෙන්රි මාර්ෂල්ගේ ප්‍රකාශයෙන් ද පැහැදිලි වේ.

"උඩරටියෝ ඉතා දීර්ඝ කාලයක් සීමා රහිත ස්වෛරී පාලනයකට සිය කැමැත්තෙන් යටත් ව සිටියෝය. මේ ස්වෛරී බලය දැඩි නමුදු පාලිත පක්ෂයේ යහපත පතා ක්‍රියා කළ යුතු ය. යන බැඳීම යටතේ ඇතැම් සිරිත් විරිත් චාරිත්‍ර අනුව රාජ්‍යය විචාරණ ලදී. ආණ්ඩු ක්‍රමයේ කවර හෝ වෙනස්වීමකට නිලමේවරු ශාප කළහ. ආණ්ඩු ක්‍රමය වෙනස් කිරීම ධර්මිෂ්ට ක්‍රියාවකැයි මහජනයා සිතන

බව පෙනිනි. ජීවිතයේ ප්‍රධාන අරමුණු පුද්ගලික ලාභයයි. උඩරට නිලමේ කෙනෙකුගේ එකම බලාපොරොත්තුව දේශපාලන බලයයි. සමාජයේ තත්ත්වය අනුව පාණ්ඩිත්‍යයෙන් හෝ ධනයෙන් හෝ ඔහුට උසස් විය නොහැකි ය. එහෙයින් තනතුර පිළිබඳව විශේෂ අයිතිවාසිකම් මගින් හා පහත් පන්තිවල ජනතාව අතර ශ්‍රේෂ්ඨත්වයක් ආරෝපනය කර ගැනීමෙන් තම කෘතිම සමාජ තත්ත්වය රැක ගැනීමට ඔවුහු බලාපොරොත්තු වූහ.”

උඩරට ගිවිසුම සමඟ නිර්මාණය වූ ව්‍යාකූලභාවය පිළිබඳව විමසීමේ දී තවත් වැදගත් කාරණයක් වන්නේ දුර බැහැර රජෙකු පිළිගැනීමට හෝ ඔහුට යටත්ව සිටීමට ජනතාව තුළ තිබූ අකමැත්තයි. ගිවිසුම් ප්‍රකාරව උඩරට රාජ්‍යය ෂෂෂ වෙනි ජෝර්ජ් නම් වූ අදෘශ්‍යමාන රජෙකු වෙත පැවරීම සම්බන්ධව රදලයන් කනස්සල්ලෙන් පසු වී ඇත. රටවැසියා ප්‍රාර්ථනා කළේ බැහැ දැක ගත හැකි රජෙකි. අතීත පාලන ක්‍රමය මගින් නිතර රජු මුණ ගැසීමටත්, තම දුක්ගැනවිලි රජුට ඉදිරිපත් කිරීමටත් ජනතාවට අවකාශ තිබුණත්, නව පාලන ක්‍රමය හමුවේ දුර රටක වාසය කරන රජෙකු පිළිබඳ ව විශ්වාසය තැබීමට ජනතාවට සිදු විය. එක් අතකින් භික්ෂූන් වහන්සේලාට පහර එල්ලවීමත්, තවත් අතකින් රදල ප්‍රධානීන්ගේ බලය සීමාවීමත් නිසා සාමාන්‍ය ජනතාව සැලකුවේ උඩරට තම අනන්‍යතාව හා ආඩම්බරය කෙලෙසා දැමීමක් ලෙස ය. එය වඩ වඩාත් උග්‍ර කිරීමට හේතු වූ කාරණය වූයේ ඉංග්‍රීසි පාලනය වෙතින් එන්න එන්නම සාම්ප්‍රදායික රාජ්‍යත්වය බිඳ වැටීමට පටන් ගැනීමයි. උඩරැටියන්ගේ විශ්වාසයට අනුව රජෙකු නොමැති තැන නීතිය, සාමය හෝ සමාදානය අපේක්ෂා කළ නොහැකි ය. මේ වන විට උඩරට ප්‍රදේශවල සිටි ගිහි පැවිදි යන දෙපිරිසටම ඉංග්‍රීසි පාලනය පිළිබඳව දැඩි අවිශ්වාසයක් පැවතින.

උඩරැටියන් හා ඉංග්‍රීසීන් අතර පැහැදිලි එකඟතාවන් දැකිය හැකි එකදු කාරණයක්වත් දැක ගත හැකි වූයේ නැත. ජන වර්ගය, භාෂාව, ආගම, සිරිත් විරිත්, හුරුපුරුදු මෙන් ම සිතුම් පැතුම් අතින් ද උඩරැටියන් හා ඉංග්‍රීසීන් අතර පැවතියේ මතභේදාත්මක ස්වභාවයකි. වරක් උඩරට ක්‍රියාත්මක වූ බ්‍රිතාන්‍ය පාලනය පිළිබඳ සාකච්ඡාවක දී එක් රදල ප්‍රධානියෙකු සඳහන් කර ඇත්තේ “එක් නගුලකට බඳින ලද මී ගොනෙකුට හා එළ ගෙ ානෙකුට සමාන වන” බවකි. ඒ ප්‍රකාශය අනුව

මෙම පාලන ක්‍රමවේද උඩරැටියන්ගේ පැවැත්මට නොගැළපුණු ආකාරය කෙතරම් ද යන්න අවබෝධ කරගත හැකි ය.

මෙතෙක් සඳහන් කරන ලද සියලු කාරණා ඔස්සේ ඉංග්‍රීසි ආණ්ඩුව කෙරෙහි සිංහලයන් තැබූ විශ්වාසය ක්‍රමක්‍රමයෙන් බිඳ වැටීමකට ලක් වූ ආකාරය හඳුනාගත හැකි ය. උඩරැටියන් හා ඉංග්‍රීසීන් අතර ඇතිවෙමින් තිබූ මෙකී දුරස්ථභාවය වාසියට හරවා ගත් ඌව-වෙල්ලස්ස ප්‍රදේශයේ වාසය කළ මුස්ලිම් ජනතාව ඉංග්‍රීසීන් සමඟ දැඩි මිත්‍රත්වයක් ගොඩ නගා ගත්තෝ ය. උඩරට ප්‍රදේශවල පවතින තත්ත්වය දැනගෙන චරපුරුෂ සේවයේ නිරතව සිටි මෙම මුස්ලිම් ජන කොටස බ්‍රිතාන්‍යයන්ගෙන් වැඩි වාසි අපේක්ෂා කර ඇත. මේ වන විට මඩිගේ (කරත්ත) දෙපාර්තමේන්තුව සම්පූර්ණයෙන් ම මුස්ලිම්වරුන් සතු වූ අතර මුහුදුබඩ ප්‍රදේශවල සිට උඩරට ප්‍රදේශවලට ලුණු ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩ ප්‍රවාහනය ඔවුන් වෙතින් සිදුවිය. පැවති සාම්ප්‍රදායික ක්‍රමය තුළ මෙකී මඩිගේ දෙපාර්තමේන්තුවේ මුහන්දිරම් තනතුර ඇතුළු ඉහළ තනතුරු සියල්ල සිංහල රදල පවුල්වල නායකයන් විසින් දරමින් සිටියේ ය. මෙකී සම්ප්‍රදාය කඩකරමින් මුස්ලිම්වරුන්ගේ ඉල්ලීම මත මඩිගේ මුහන්දිරම් තනතුරට හජ්ජි මරික්කාර් නැමති මුස්ලිම් මුහන්දිරම්වරයකු පත් කිරීම නිසා උඩරැටියන්ගේ විශ්වාසය තව දුරටත් පලුදු වී තිබේ. මෙම පත් කිරීම නිසා මුස්ලිම්වරුන් සිංහලයන්ට ගෙවිය යුතු බදු ගෙවීම පවා අත්හිට වූ අතර සිංහල ප්‍රධානීන්ගේ සාම්ප්‍රදායනුකූල නිලතලවලට ද එමගින් පහර වැදී තිබේ. මෙම සම්ප්‍රදාය විරෝධී ක්‍රියාවෙන් සිංහල ප්‍රධානීන් මෙන්ම වෙල්ලස්සේ සාමාන්‍ය ජනතාව පවා ඉංග්‍රීසි ආණ්ඩුව කෙරෙහි දැඩි අප්‍රසාදයක් ගොඩනංවාගෙන තිබේ. තව තවත් අසහනයට හා පීඩාවට පත් වූ වෙල්ලස්සේ ජනයා ඉංග්‍රීසි ආණ්ඩුවට එරෙහිව, අහිමි වී ගිය උරුමය පතා සංවිධානාත්මක විමුක්ති අරගලයකට ප්‍රවේශය ගෙන තිබේ.

1818 විමුක්ති අරගලය නිදහස් සටනේ ශක්තිමත්ව මුලාරම්භයයි. ඒ නිසා ඉංග්‍රීසි පාලන ඒකාධිකාරියට එරෙහිව ජනතාව පෙළගස්වා විමුක්ති අරගලයකට දායකත්වය ලබාදීම කැප්පෙට්ටිපොළ වීරයාගේ උත්කෘෂ්ඨ සේවයයි. සැබෑ ලෙසින් මව්බිමට ගෞරවනීයත්වය පුදකළ වීරවරයින් විශාල ප්‍රමාණයක් එම සටනින් ජීවිත පරිත්‍යාග කර ඇත. "**මා දැන් තුණුරුවන් නමැද ඉතිපිසෝ ගථාව කියමි. මා දන්වා සිටින විට එක කඩු පහරින් මාගේ ගෙල කපා දමව්, යනුවෙන්**

**අභිත ප්‍රකාශය කරමින් විමුක්තිය උදෙසා ජීවිතය පුජාකළ කැප්පෙට්ටිපොළ අධිකාරම්ගේ නාමය අභීත වීරවරයන්ගේ නම් අතරට එක් වන්නේ ඔහු මරණයේදී පවා පෙන්නුම් කළ අභිත ලීලාව නිසාය.** ඔහු මරණයට මුහුණ දුන් අභිත ලීලාව පුදුම දනවන සුළුය. ඉංග්‍රීසින් කෙතරම් භීතියට පත්වීද යත් මේ අසමාන, අසහාය මිනිසාගේ හිස එඩින්බරෝ නුවර කපාලවිද්‍යා සංගමයේ කෞතුගාකාරයේ විශේෂ පරීක්ෂාවකට පවා ලක්කිරීමට පියවර ගෙන තිබේ. 1818 ජනවාරි මාසයේ රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයාගේ විශේෂ නිවේදනය මේ ජාතිකවීරවරයා ජාතිද්‍රෝහියකු බවට පත්කර තිබුණත් ජාතික වීරවරයන් එකී අවමානයෙන් නිදොස් කොට ගෞරාවාන්විත තැනක පිහිටුවීමට වර්ෂ 2016 දී වත්මන් රජය පියවර ගෙන තිබේ. කෙසේ වෙතත් කිවුලේ ගෙදර මොහොට්ටාල, කොහුකුඹුරේ රටේ රාළ හා බුටාවේ රාළ යන ඌවේ ප්‍රභූන්ගෙන් ඇරඹුන **මෙම ජාතික අරගලයට නායකත්වය දුන් මොණරවිල කැප්පෙට්ටිපොළ ජාතික වීරයා වෙත ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය.**

ඌව වෙල්ලස්ස ජාතික විමුක්ති සටන් ව්‍යාපාරය වෙනුවෙන් දිවිපිදූ මොනරවිල කැප්පෙට්ටිපොළ අධිකාරම් ප්‍රමුඛ ප්‍රධාන සටන්කාමීන්ට සමානව ඉතා නිර්භීත අයුරින් අරගලය මෙහෙය වූ ප්‍රාදේශිය වීරයන් රැසක් ද හඳුනාගත හැකිය. එවන් ප්‍රාදේශිය වීරවරයන්ට ශ්‍රී ලාංකේය ඉතිහාස සම්ප්‍රදාය තුළ නිසි ගෞරවය පුද ලැබෙන්නේ ද යන්න ගැටලුවකි. ඉසිලිය නොහැකි බදු බරත්, අමානුෂිය පරිපාලනයක්, ඉවසාගත නොහී විමුක්තිය උදෙසා සටන් කළ ප්‍රාදේශිය නායකයන් තුළ ද පැවතියේ සැබෑ දේශප්‍රේමියත්වයයි. ඉංග්‍රීසි යුද්ධාධිකරණය මගින් මරණ දඬුවම ලබාගත් මඬුල්ලේ පුංචිරාල, මඬුල්ලේ අරුමා, බලංගොඩ, කිංචිමැනිකා දුරයාද, බදුල්ලේ කිරිනයිදා දුරයා, පරණගම කිරිනයිදා දුරයා, රාහුපොළ පිහින රාළ, මීගහපිටිය රටේ රාළ වැන්නන් ද සිංහලයේ විමුක්තිය උදෙසා දිවි පිදූ විමුක්තිකාමීන් ලෙස ගෞරවාන්විත තැනක පිහිටවිය යුතුය. සංග්‍රාමය නිමවීමෙන් පසු ඉංග්‍රිසින් විසින් මුරිසි දිවයිනට පිටමං කිරීමට තීරණය කළ යටිනුවර, පිළිමතලාවේ දිසාව, මත්තමගොඩ තුන්කෝරලේ දිසාව, දෙමෝදර මොහොට්ටිලා, කොහුකුඹුරේ රටේ රාළ වැනි විරයන් රැසක් සිරකරුවන් ලෙසම මරණය ළඟා කර ගෙන තිබේ. ප්‍රකට වුවත්, අප්‍රකට වුවත් මොවුන් සියල්ලම විමුක්ති අරගලයක්

වෙනුවෙන් අවසන් හුස්ම පොද වෙන්කළ සැබෑ වීරවරයෝ ය. ඒ නිසා මේ සියල්ලන්ටම ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතු ය.

අනලස්ව අධිෂ්ඨානයෙන් හා විරියයෙන් ළඟා කරගත් ජයග්‍රහණ ශ්‍රී ලාංකේය ඉතිහාසය පුරාවටම දැකිය හැකිය. විදේශීය ආක්‍රමණිකයන්ට විරුද්ධව විමුක්තිය උදෙසා සටන් වැදුණු විරෝදාර මුතුන් මිත්තන් අපේ සමාජයට සැබෑ වීරවරයෝය. ආක්‍රමණිකයන් ඉදිරියේ ඔවුන් දේශද්‍රෝහීන් වුවත් ජාතිකත්වය හමුවේ වීරයන් ය. 1818 දී ඌව වෙල්ලස්සෙන් ඇරඹි ඉංග්‍රීසි විරෝධී විමුක්ති අරගලය ව්‍යාකූලතා රැසක් වෙනුවෙන් වූ ජනතා නැගී සිටීමකි. 1815 දී උඩරට දේශීය ප්‍රධානීන් හා ඉංග්‍රීසීන් අතර ඇති වූ සම්මුතිය හා එහි කොන්දේසි එකින් එක බ්‍රිතාන්‍ය පාලනය හමුවේ බිඳ වැටෙන්නට පටන් ගත් නිසා උඩරැටියන් හා ඉංග්‍රීසින් අතර විශ්වාසය පළුදු වී තිබේ. සාම්ප්‍රදායිකව ආරක්ෂා වෙමින් ආ ජාතිකත්වය හා බෞද්ධාගමික පරිසරය විදේශීය ජාතියක් හමුවේ අනතුරකට ලක්වන විට ඒ වෙනුවෙන් වූ ජනතා නැඟි සිටීම 1818 විමුක්ති අරගලයයි. උඩරට හවුල් පාලනය උදෙසා ගිවිස ගත් දෙපාර්ශ්වය අතර මත ගැටුම් නිසා 1815-1818 අතර දේශපාලනික, සමාජ, සංස්කෘතික, ආර්ථික හා ආගමික වශයෙන් ඇති වූ ව්‍යාකූලභාවය 1818 ඌව වෙල්ලස්ස විමුක්ති අරගලයට පදනම් සැකසූ බව අවසාන වශයෙන් නිගමනය කළ හැකි ය.



